# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2307/06 – 2022 නොවැම්බර් මස 21 වැනි සඳුදා – 2022.11.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/265.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.11.19 දිනැති හා අංක 2254/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.11.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙහිවල, නගරසභා පටුමග, අංක 10 හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය සහ මල්වාන, බියගම අපනයන සැකසුම් කලාපය හි පිහිටි ඩිලාරූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 38120 – 19 (2022.11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය: ඒ/63/2021
IR/COM/05/2018/265

අන්තර් සමාගම් සේවක සංගමය,
නො. 10,
නගර සභා පටුමග,
දෙහිවල.

එරෙහිව,

ඩිලාරූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි
ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අපනයන සැකසුම් කලාපය,
බියගම,
මල්වාන.

වර්ෂ 2022ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින දීය.

ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පරිදි කම්කරු ආරාවුලට හේතු වී ඇති කරුණ වනුයේ,

'' ඩිලාරූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ මුද්‍රණ අංශයේ සේවය කරන ලද පහත නම් සඳහන් සේවකයින් 21 දෙනාහට සම්පූර්ණ වැඩ පැය ගණනම එම අංශයේ සේවය කිරීමට ලබා නොදී (24 x 7) සේවා මුරය අහිමි කිරීමෙන් යම් අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදු ව තිබේනම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් කවරේද ? යන්න පිළිබඳව වේ.''

01. ටෙරන්ස් ජයතිලක
02. ආර්. බුද්ධික රාජපක්ෂ
03. එම්. ඒ. එන්. ප්‍රසංග ජයවර්ධන
04. ආර්. ආර්. සුමේධ ආරියසිංහ
05. පාලිත කුමාර
06. සචින්ත පෙරේරා
07. බුද්ධි දළුගම
08. ජානක හෙට්ටිආරච්චි
09. පුබුදු රුවන්
10. දමිත් පෙරේරා
11. පී. ඒ. ජගත්
12. සුරන්ජිත් උදයකුමාර
13. ප්‍රදීප් මාලින්ද
14. අනුරාධ වල්පොල
15. කෝකිල වසන්ත
16. ආර්. ටී. ඩී. රාජපක්ෂ
17. ප්‍රදීප් නිශාන්ත
18. ඉරේෂ් නුවන්
19. ප්‍රීමාල් පෙරේරා
20. මනෝජ් පීරිස්
21. ඉසුරු මල්ලවආරච්චි

වගඋත්තරකාර ආයතනය සමග කාර්මික ආරාවුලක් ඇති බව දන්වා සිටිමින් ඉල්ලුම්කරුවන් විසින් සිදුකරන ලද පැමිණිල්ල ප්‍රකාරව අදාළ කාර්මික ආරාවුල විභාගයට ගැනීමට තීරණය කරමින් අදාළ ආරාවුල පිළිබඳව ඉදිරිපත් කිරීමට ඇති සම්පූර්ණ විස්තර ප්‍රකාශයක් මෙම අධිකරණය වෙත ලැබෙන්නට සලස්වන ලෙස දන්වමින් දෙපාර්ශ්වයටම වර්ෂ 2021.11.22 දින යවා ඇත.එයට ප්‍රතිචාර දක්වමින් වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් මූලික ප්‍රකාශයක් එවා ඇති නමුත් ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඒ පිළිබඳව ද කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. අද දින මෙම ආරාවුල විමසීමට ගන්නා බවත්, ඒ සම්බන්ධයෙන් නීතිඥවරුන් හෝ බලය පවරන ලද නියෝජිතයන් සමග පෙනී සිටින ලෙසත් දන්වමින් වර්ෂ 2022.01.26 වැනි දින දෙපාර්ශ්වයටම දැන්වීම් යවා ඇත. නමුත් ඉල්ලුම්කරුවන් ඒ සම්බන්ධයෙන්

ද කිසිදු උනන්දුවක් දක්වා නොමැති අතර අද දින ඉල්ලුම්කරුවන් හෝ ඔවුන් වෙනුවෙන් කිසිදු පෙනීසිටීමක් සිදුකර නොමැත. ඉහත සඳහන් සියලු කරුණු අනුව මෙම අධිකරණයට පෙනී යන්නේ ඉල්ලුම්කරුවන් ඉල්ලීම සම්බන්ධයෙන් සිදු උනන්දුවක් නොදක්වන බවයි. එහෙයින් මෙම ඉල්ලීම නිශ්ප්‍රභ කරමි.

ජනජිත් ද සිල්වා,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 15 වැනි දින,

EOG 11 - 0235

---

මගේ අංකය: IR/COM/01/2017/156.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ අංක 2020.11.25 දිනැති හා අංක 2203/23 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.10.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. තංගල්ල, උස්වැව, ගුරුගොඩැල්ල, 9/සී/13/ හි පදිංචි පී. ඒ. කේ. ප්‍රදීප් මයා , 2. හක්මන මිද්දෙනියගොඩ, ''සෙව්වන්දි නිවස'' හි පදිංචි ජී. ආරියවංශ මයා, 3. දික්වැල්ල, සිරිසුමන මාවත, ''චන්දන'' හි පදිංචි එස්. එච්. නිමල්සිරි මයා, 4. රත්නපුර, ගනේගොඩ, අංගම්මන පාර, අංක 185/19 හි පදිංචි කේ. ඒ. පී. පී. එස්. පීරිස් මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය.**

බේරුම්කරු ඩී. ජී. කේ. කරුණාරත්න මහතා ඉදිරිපිටදී ය.
ගොනු අංකය: IR/COM/01/2017/156
බේරුම්කරණ අංකය: A/58/2020

පී. ඒ. කේ. ප්‍රදීප් මයා,
9/සී/13, ගුරුගොඩැල්ල,
උස්වැව, තංගල්ල.

ජී. ආරියවංශ මයා,
''සෙව්වන්දි නිවස'',
මිද්දෙනියගොඩ,
හක්මන.

එස්. එච්. නිමල්සිරි මයා,
''චන්දන'', සිරිසුමන මාවත,
දික්වැල්ල.

කේ. ඒ. පී. පී. එස්. පීරිස් මයා,
අංක 185/19, අංගම්මන පාර,
ගනේගොඩ, රත්නපුර.
පළමු පාර්ශ්වය

එදිරිව,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.
**දෙවන පාර්ශ්වය**

**අතර පවත්නා කාර්මික ආරාවුල**

පෙනී සිටීම
පළමු පාර්ශ්වය වෙනුවෙන්: 1. නියෝජිත ග්‍රේෂන් සිල්වා මහතා
2. නෙල්සන් ප්‍රනාන්දු මහතා
3. එම්. කේ. හේමපාල මහතා

දෙවන පාර්ශ්වය වෙනුවෙන්: 1. නීති නිලධාරිනි ශානිකා ගාල්ලගේ මහත්මිය
2. නීති නිලධාරිනි නිමංෂා විතාන මහත්මිය
3. රජයේ නීතිඥ ෆසීලා කබීර් මහත්මිය
4. නීතිඥ තාරිකා හේවගේ මහත්මිය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල්) (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ඩී. ජී. කේ. කරුණාරත්න වන මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ.

'' ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තංගල්ල ඩිපෝවේ ආරක්ෂක නියාමකයන් ලෙස සේවය කළ පී. ඒ. කේ. ප්‍රදීප්, ජී. ආරියවංශ, එස්. එච්. නිමල්සිරි, කේ. ඒ. ඒ. පී. පී. එස්. පීරිස් යන සේවකයින් සම්බන්ධයෙන් 2014.08.26 දින ලබා දී ඇති විනය නියෝගය යුක්ති සහගත ද '' එසේ නැත්නම් එම සේවකයන්ට හිමිවිය යුතු යම් සහනයක් ඇත් ද යන්න පිළිබඳව වේ.''

**පසුබිම**

ශ්‍රී ලං.ග.ම. තංගල්ල ඩිපෝවේ ආරක්ෂක පරීක්ෂක ඩබ්. ඒ. කේ. වික්‍රමසිංහ මහතා 2013.11.08 දින රාත්‍රී ආරක්ෂක අංශයේ ආරක්ෂක නියාමකයන් සේවයේ යෙදී සිටියදී රාත්‍රී 22.50 ට පැයට ඔහු සිටි කාර්යාලය තුළට ඇතුල් වී යම් දුගඳ හමන දියරයකින් ඔහුට පහර දී ඇත.

එසේ පහර දී පලාගිය පුද්ගලයා අල්ලාගැනීම සඳහා සේවයේ යෙදී සිටි ආරක්ෂක නියාමකයින් වන පී. ඒ. කේ.ප්‍රදීප්, ජී. ආරියවංශ, එස්. එච්. නිමල්සිරි හා කේ. ඒ. පී. පී. එස්. පීරිස්, යන හතරදෙනා අසමත්වීමත් පහරදුන් පුද්ගලයාට පහසුවෙන් පැන යා හැකි අන්දමට ප්‍රධාන දොරටුවේ කොටසක් විවෘතව තබා ඇති බවත්, එම පුද්ගලයා අල්ලා ගැනීමට මේ සතර දෙනා කිසිදු උත්සාහයක් දරා නැති බවත් චෝදනා නගා ඇත.

මේ සිද්ධිය සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා ප්‍රධාන ආරක්ෂක නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් කේ. ඒ. මිහිරංග හා ආර්. එස්. පාසිගම යන අය පත්කර ඇත. මූලික විමර්ශන වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ සතර දෙනාට චෝදනා පහ බැගින් වූ චෝදනා පත්‍ර ගොනුකර ඇත.

චෝදනා විභාග කිරීමෙන් අනතුරුව සේවය තහනම් කරමින් සහකාර මානව සම්පත් කළමණාකරන (විනය) විසින් 2013.11.12 දාතමින් යුතු ලිපියෙන් කේ. ඒ. පී. පී. එස්. පීරිස් මහතාගේ සේවය තහනම් කර ඇත.

පී. ඒ. කේ. ප්‍රදීප් යන අයගේ සේවය තහනම් කිරීමේ ලිපිය සහකාර මානව සම්පත් කළමනාකරණ (විනය) විසින් 2014.01.29 වැනි දින නියෝග කර ඇත. ජී. ආරියවංශ යන අයගේ සේවය තහනම් කිරීම 2013.11.13 වැනි දින තංගල්ල ඩිපෝ කළමණාකාර විසින් සිදුකර ඇත.

මෙම සිව්දෙනාගේම සේවය තහනම් කර ඇත්තේ වේතන රහිතව බව එම ලිපිවල දක්වා ඇත. හතරදෙනාටම ලබා දී ඇති චෝදනා පත්‍රවල සඳහන් චෝදනා මෙසේ වෙයි.

1. 2013.11.08 හෝ ඊට ආසන්න දිනකදී ආරක්ෂක පරීක්ෂක වික්‍රමසිංහ මහතාට දුගඳ හමන දියරයකින් පහරදීමට ආධාර අනුබල දීම.
2. ආරක්ෂක නියාමකවරයකු ලෙස රාජකාරි පැහැර හැරීම.
3. පරිපාලන නිලධාරින් තැතිගැන්වීමට ආධාර අනුබල දීම.
4. ආරක්ෂක රාජකාරිය කඩාකප්පල් කිරීමට ක්‍රියා කළේය.
5. ඉහත චෝදනා එකක්, කීපයක් හෝ සියල්ලම සිදුකිරීම හේතුවෙන් ලං.ග.ම. ඔබ කෙරෙහි තිබූ විශ්වාසය කඩ කලේය යනුවෙනි.

විනය විභාගයෙන් අනතුරුව මේ සතර දෙනාව තංගල්ල ඩිපෝවෙන් අම්බලන්තොට ඩිපෝවට ස්ථාන මාරු කර ඇත. ඊට අමතරව සේවා තහනම් කාලය දඬුවමට යටත් කොට සේවයේ පිහිටුවා ඇත. වැඩ තහනම් කාලය සඳහා නොගෙවූ වේතන අහිමිකර ඇත.

මේ සඳහා අභියාචනා ඉදිරිපත් කර ඇතත් එම තීන්දුවම එලෙසට ක්‍රියාත්මක කරන බව එස්. එච්. නිමල් හා කේ. ඒ. පී. පී. එස්. පීරිස් යන අයට දැනුම් දී ඇත.

ප්‍රදානය

<u>ප්‍රදානය දීමේදී අවධානයට ලක්කරන ලද කරුණු</u>

පළමු පාර්ශ්වය විසින් 2021.01.22 දින සිය පළමු ප්‍රකාශය ඉදිරිපත් කරමින්,
මෙම සිව්දෙනාට 2013 නොවැම්බර් මස තංගල්ල ඩිපෝවේ ආරක්ෂක නියාමකයන් ලෙස සේවය කළ බවත් 2013.11.08 වැනි දින තමන්ට අයත් ආරක්ෂක පර්යන්ත ස්ථානවල සේවයේ යෙදී සිටි බවත් කියා සිටිති.

මේ සතර දෙනාට චෝදනා පත්‍ර නිකුත් කොට පැවැත්වූ විනය විභාග නිලධාරි පැමිණිල්ල මෙහෙයවන කටයුතු කල බවත් විත්තියට හරස් ප්‍රශ්න ඇසීමට ඇති අයිතිය ද අහිමි කළ බවත්, විභාගය අසාධාරණ අන්දමින් පැවැත්වූ බවත් පැමිණිලි ලේඛන 1-18 දක්වා ඉදිරිපත් කරමින් කියා සිටී.

දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වකරුවන් වෙත පනවා ඇති අයුක්ති හා අසාධාරණ විනය නියෝගය බල රහිත කරන ලෙසත් ඔවුන්ට අහිමි කල සම්පූර්ණ වේතනයත් දෙවන පාර්ශ්වකරුවන්ගෙන් අයකරන ලෙසටත් ගරු අධිකරණයේ අයැද සිටී.

2021 පෙබරවාරි මස 17 වැනි දින දෙවන පාර්ශ්වය විසින් සිය උත්තර ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. චූදිත නිලධාරින් හතර දෙනාට තංගල්ල ඩිපෝවේ ix වන ශ්‍රේණියේ ආරක්ෂක නියාමකවරුන් ලෙස සේවය කල බවත්, 2013.11.08 වැනි දින ආරක්ෂක පරීක්ෂක වික්‍රමසිංහ මහතාට දුගන හමන දියරයකින් පහර දීමට ආධාර සහ අනුබල දෙමින් කඩාකප්පල්කාරී ක්‍රියාවක නිරතවීමෙන් විෂමාචාරයන් සිදුකල බවත්, එම නිසා සේවය තහනම් කල බවත්, චෝදනා 05 කින් චෝදනා කල බවත්, චෝදනාවන්ට වරදකරුවන් වූ නිසා,

1. සේවා තහනම් කාලය දඬුවමකට යටත් කොට සේවයේ පිහිටුවීම
2. වහාම බලපවත්වන පරිදි අම්බලන්තොට ඩිපෝවට ස්ථාන මාරු කිරීම යන දඬුවම් පමුණුවා ඇත.

දෙවන පාර්ශ්වය ගරු අධිකරණයෙන් අයැද සිටින්නේ,

1. ඉල්ලුම්කරුගේ පැමිණිල්ල මුල් අවස්ථාවේ දීම නිෂ්ප්‍රභා කරන ලෙසත්,
2. නඩු ගාස්තු ලබාදෙන ලෙසත්ය.

2021.03.25 වැනි දින සැසිවාරයේදී නඩුව කඩිනමින් අවසන් කිරීම සඳහා ඉල්ලුම්කාර පක්ෂය යෝජනා කරන්නේ,

1. හිඟ වැටුප් ගෙවන්නේ නම් සමථයකට එකඟවන බවයි.
2. ඉල්ලුම්කරුවන්ගේ මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශ මගින් ඉදිරිපත් කිරීමටයි.

සමථය සම්බන්ධව ඊළඟ නඩු දිනයේ දී දැනුවත් කළ හැකි බව දෙවන පාර්ශ්වය කියා සිටී.
චූදිත නිලධාරි පී. ඒ. කේ. ප්‍රදීප් මහතා සහ අනෙක් තිදෙනා එනම් ජී. ආරියවංශ, එස්. එච්. නිමල්සිරි හා කේ. ඒ. පී. පී. පීරිස් යන අය මෙම නඩුවේ පළමු පාර්ශ්වය වෙනුවෙන් 2021.04.03 වන දින දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇත.

ඔවුන් 04 දෙනාට අසාධාරණ හා අයුක්ති සහගත අන්දමින් දඬුවම් ලබා දී ඇති බවත්, විනය පරීක්ෂණය අපක්ෂපාති නැති බවත් විනය පරීක්ෂණයේදී විනය විභාග නිලධාරි විසින් පැමිණිල්ල මෙහෙයවීම් කටයුතු ද සිදුකල බවත් ඔවුන්ගේ නියෝජිතයාට හරස් ප්‍රශ්ණ ඇසීමට පවා බාධා කළ බවත් ඔවුන්ට විශේෂ කිසිදු ඇසින් දුටු සාක්ෂියක් ඔප්පු නොවී තිබියදී පමුණුවන ලද විනය දඬුවම සාධාරණ හා අයුක්ති සහගත බවත් දිවුරුම් ප්‍රකාශය මගින් කියා සිටී.

1. චූදිත 04 දෙනාට පමුණුවා ඇති විනය දඬුවම අහෝසි කරන ලෙසත්,
2. වැඩ තහනම් කර ඇති කාලයට හිමි සියළු දීමනා සහිත හිඟ වැටුප් ලබාදෙන ලෙසත් ප්‍රධානයන් ලබාදෙන ලෙසට ගරු අධිකරණයෙන් එම දිවිරුම් ප්‍රකාශය මගින් අයැද සිටී.

2021.04.20 වන දින පැවති නඩු විභාගයේදී නැවතත් සමථයකට එළැඹීම සඳහා ඉල්ලුම්කාර පාර්ශ්වය කියා සිටියේ නතරකර ඇති හිඟ වැටුප ගෙවන්නේ නම් සමථයකට එළැඹිය හැකි බවයි.

වගඋත්තර පාර්ශ්වය කියා සිටින්නේ 100% නොව යම්කිසි ප්‍රමාණයක් සඳහා එකඟ වන්නේ නම් සලකා බැලිය හැකි බවයි. ඉල්ලුම්කාර පාර්ශ්වය ඊට එකඟත්වය පලකලේ නැති බැවින් වගඋත්තරකාර පාර්ශ්වයට සලකා බැලීමේ හැකියාවක් නොමැති බව ප්‍රකාශ කරයි. දෙවන පාර්ශ්වයේ නීතිඥ විසින් දිවුරුම් ප්‍රකාශය ලබා දී තිබූ ප්‍රදීප් යන අයගෙන් හරස් ප්‍රශ්ණ විමසයි.

ප්‍ර : දුගඳ හමන දියරය වික්‍රමසිංහ මහතාගේ ඇඟට විසිකරේ කවුද කියල ඔබ දන්නවද?
පි : දන්නේ නෑ (සාක්ෂි සටහන් 6 පිටුව)

සැකකරු හඳුනන්නේ නැතිනම් 1 වන චෝදනාව දක්වෙන අන්දමට අනුබල දෙන්නේ කෙසේ ද?ආධාර අනුබල දීමක් කිරීම සඳහා පුද්ගලයකු දැන සිටිය යුතු ය. චූදිත නිලධාරීන් සැකකරුට ආධාර අනුබල දුන්නා යන්න සනාථ කිරීම සඳහා කිසිම සාක්ෂියක් වගඋත්තරකාර පක්ෂය ඉදිරිපත් කර නැත.

එම චෝදනාව ඔප්පු කිරීම සඳහා වාචික හෝ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොමැති නිසා එම චෝදනාවට චූදිත නිලධාරීන් වරදකරුවන් නොවේ. මේ සතර දෙනාම දෙවන චෝදනාවන්ට ආරක්ෂක නියාමකවරු ලෙස වගකිව යුතුය.

ප්‍ර : සැකකරුගේ මුහුණ ඔබ හඳුනාගන්නවා ද?
පි : අඳුරගන්න දැක්කේ නෑ. කළුවරේ ගියේ
ප්‍ර : සැකකරු අල්ලගන්න උත්සාහ කරේ නැත්තේ ඇයි?
පි : අල්ලගන්න උත්සාහ කරා. මට කෑ ගැහුවම මම ඒ අවස්ථාවේ දී ආරක්ෂක මහතා එක්ක පිටිපස්සේ දිව ගියා (සාක්ෂි සටහන් 7 පිටුව)

මේ සිද්ධිය සම්බන්ධයෙන් වික්‍රමසිංහ මහතා තංගල්ල පොලීසියට කල පැමිණිල්ල xi වශයෙන් ලකුණු කර ඇති නම් රූපවාහිනිය බලමින් සිට රාත්‍රී 10.55 ට පමණ දෙර ඇරගෙන ආපු කෙනා කලුතෙල් ගහපු කෙනා අඳුනාගන්නට බැරි වූ බවත් දැනට කිසිවෙකු ගැන සැකයක් නැති බවත් ප්‍රකාශයේ සඳහන් වේ.

වික්‍රමසිංහ මහතා හරස් ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින් සාක්ෂි දී සිටින්නේ නම් දිවුරුම් ප්‍රකාශය 2022 ජනවාරි මස 01 වෙනි දින 11.00 පැයට ලබාදුන් බවයි. නැවත විමසීම්වලදී ඔහු කියා සිටින්නේ දිවුරුම් ප්‍රකාශය ජනවාරි 11 වන දින ලබාදුන් බවයි. එය අසත්‍යයක් බව ඔහු පිළිගනී. (සා.ස. 20 පිටුව)

දිවුරුම් ප්‍රකාශයේ අංක 02 යටතේ 12 වන පාර්ශ්වයේ එනම් ශ්‍රී ලං.ග.ම. සේවකයකුව සිට යන්න ගැන නැවත විමසීම්වලදී අසන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් කියා සිටියේ ''දෙවන පාර්ශ්වය වෙන්න ඕන'' වික්‍රමසිංහ මහතා පොලිසියට කල පැමිණිල්ලේ සහතික කර ඇත්තේ කලුතෙල් වලින් පහර දුන් බවයි. එහෙත් ඩිපෝ කළමණාකාරවරයාට 2013.11.09 දින ලබාදුන් ලිපියේ සඳහන් කර ඇත්තේ දුගඳ හමන අපද්‍රව්‍ය ඇතුළත් ජල ප්‍රහාරයකින් පහර දුන් බවයි. තව ද පොලිස් පැමිණිල්ලේ තමා රූපවාහිණිය බලමින් සිටි බව කියා ඇතත් ඩිපෝ කළමණාකාරතුමාට ලබාදුන් ලිපියේ සඳහන් කර ඇත්තේ මුදල් අයකැමි ලඟ සිටි බවයි. මේ අදහස් පරස්පර විරෝධී බව නිගමනය කරමි.

වික්‍රමසිංහ මහතා ඩිපෝ කළමණාකාර මහතාට ලබාදුන් ලිපියේ X 2 හි මුදල් අයකැමි ජෝතිමුණි මහතා ළඟ සිටි බව සඳහන් කර තිබේ. ජෝතිමුණි මහතා මූලික විමර්ශනයේ ලබාදුන් ප්‍රකාශයේ R 22හි සඳහන් කරන්නේ '' කාර්යාලය තුළ මුදල් කවුන්ටරය ඉදිරියට වන්නට යම්කිසි දියරයක් විසිරී තිබුණා. ගඳකුත් වහනය වුණා'' යනුවෙනි. වික්‍රමසිංහ තමා ළඟ සිටියා නම් මුදල් අයකැමි ජෝතිමුණි මහතා දුගඳ හමන දියරයකින් වික්‍රමසිංහ මහතාට පහරදෙන බව අනිවාර්යයෙන්ම දැකිය යුතුය.

ආරක්ෂක පරීක්ෂක වික්‍රමසිංහ මහතා චාජර් විදුලි පන්දමක් රැගෙන මුදල් කවුන්ටරයේ අප ලඟට පැමිණ ඒ අසල රැඳී සිටියා. 23 පැයට ආසන්න වේලාවකදී වික්‍රමසිංහ මහතා ඉතා උස්හඬින් කෑ ගසමින් ඩිපෝ කාර්යාලයේ ප්‍රධාන දෙරටුවෙන් එළියට යනු දුටුවා. එවිට මා දුටුවා මුදල් කවුන්ටරයට ඉදිරියට වන්නට යම්කිසි දියරයක් විසිරී ඇති බව. (R 22) පැ. 25 එනම් ( R 22) මෙම ප්‍රකාශයද මෙම චෝදනා සනාථ කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ.

මූලික විමර්ශනයේදී ප්‍රකාශ ලබාදුන් ජෝතිමුණි මහතා ( R 22) හෝ සිරිල් මහතා ( R 19) සුමනසිරි මහතා ( R 18) යන අය සිය ප්‍රකාශ තහවුරු කිරීම සඳහා බේරුම්කරණයේ දී සාක්ෂි දීමට ඉදිරිපත් නොකිරීමද අඩුපාඩුවකි. මෙම ප්‍රකාශ ලබාදුන් කිසිවෙකු වික්‍රමසිංහ මහතා දුගඳ හමන දියර බාල්දියකින් පහර දෙනු දැක නැත. වික්‍රමසිංහ මහතා ''අන්න අල්ලපියෝ'' යනුවෙන් හඬනගා කෑගසනු ඇසී ඒ දෙසට පැමිණි බව ප්‍රකාශ කර ඇත.

''කලුතෙල් ද අපද්‍රව්‍ය ඇතුළත් ජල ප්‍රහාරද වෙනසක් නෑ'' වශයෙන් අසන ප්‍රශ්ණයට වික්‍රමසිංහ මහතා ලබාදෙන පිළිතුර වූයේ ''නෑ'' යනුවෙනි. කලුතෙල් වල හා අපද්‍රව්‍ය ඇතුළත් ජල ප්‍රහාර හෝ සිදුවිය හැකි හානියේ වෙනසක් නැති බවද වික්‍රමසිංහ මහතා කියා සිටී.(සාක්ෂි සටහන් පිටු අංක (22, 23) වික්‍රමසිංහ මහතාගේ සාක්ෂිය පරස්පර විරෝධී වන බැවින් ඒ පිළිබඳ සැකයක් මතුවේ.

මූලික විමර්ශනය පැවැත්වූ රෙක්ස් සුජීව පාඬිගම මහතා වගඋත්තර පක්ෂය වෙනුවෙන් සාක්ෂි කැඳවා සිටී. පාඬිගම මහතා මූලික විමර්ශනයේදී ප්‍රකාශ 14ක් ලබාගත් බවත් ඡායාරූප 9ක් උපයෝගී කරගත් බවත් ප්‍රකාශ කරයි. මූලික විමර්ශන වාර්තාව අනුව එදින ප්‍රධාන දොරටුවේ රාජකාරි කළ ආරක්ෂක නියාමක ඩී. පී. එස්. පීරිස් හා ජී. ආරියවංශ යන අය වරදකරුවන් ලෙස සඳහන් කර ඇත.

R(10) ලේඛනය අනුව 2013.11.08 වන දින ආරක්ෂක නියාමකවරයා මේ දෙදෙනාගේ අත්සන් හා පැමිණීමේ වේලාව සහතික කර ඇති බව ඔහු සාක්ෂි දෙමින් කියා සිටී. (සාක්ෂි සටහන් 9 සහ 10 පිටුව)

ප්‍ර : මේ සිද්ධිය සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි තිබේ දැයි ඇසූ විමසීමට පාඬිගම මහතා ලබාදුන් පිළිතුර අනුව ඇසින් දුටු සාක්ෂි කිසිවක් තිබූ බවක් සඳහන් නොවේ.

පි. : දුගඳ දියරයකින් පහරදීම වික්‍රමසිංහ මහතාගේ සාක්ෂියෙන් පමණක් ප්‍රකාශ වන අතර පහරදුන් පුද්ගලයා පලායාම සම්බන්ධව ඇසින් දුටු සාක්ෂි නැති බව කියා සිටී.

වික්‍රමසිංහ මහතා පොලීසියට කල පැමිණිල්ලේ කලුතෙල් වලින් පහරදුන් බවත්, කළමණාකාරවරයා ලබාදුන් ලිපියේ දුගඳ හමන දියරයකින් පහරදුන් බවත් කල ප්‍රකාශවල පරස්පර විරෝධී බව පිළිබඳ පාඬිගම මහතා මූලික විමර්ශනයේදී සලකා නොබැලීම විමර්ශනයේ අඩුපාඩුවකි. එමෙන්ම පහරදී පලායන යතුරු පැදියේ අංකය MI 3771 වශයෙන් ද, වික්‍රමසිංහ මහතා විසින් තංගල්ල පොලිසීයට කරන ලද පැමිණිල්ලේ යතුරු පැදියේ අංකය GI 5078 වශයෙන් සඳහන් කර ඇත.මෙහි සැබෑ අයිතිකරු කවුරුදැයි නියතවම දැනගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් විමසා නොබැලීම ද මූලික විමර්ශනයේ අඩුපාඩුවකි.

ආරක්ෂක නියාමක මේ සතර දෙනාට ඔවුන් වෙත නිකුත් කර තිබූ චෝදනාපත්‍ර වල සඳහන් චෝදනා 05 න් පළමුවන චෝදනාව වූ දුගඳ හමන දියරයකින් පහරදීමට අනුබල දුන් බවක් කිසිම සාක්ෂියකින් ඔප්පුකල නොහැකි නිසා ඔහුහට ඒ චෝදනාව යටතේ ලබා දී ඇති දඬුවම අසාධාරණ බවට නිගමනය කරමි. එමෙන්ම පරිපාලන නිලධාරීන් තැතිගැන්වීමට ආධාර අනුබල දුන් බවක් සාක්ෂි මතින් තහවුරු නොවන නිසා එම චෝදනාවට ඔවුන් වෙත පමුණුවා ඇති දඬුවම අසාධාරණ බවට නිගමනය කරමි. ආරක්ෂක රාජකාරිය කඩාකප්පල් කිරීමට ක්‍රියාකල බවත් සාක්ෂි මතින් සනාථකර ඇත. R16 දෙවන ඡායාරූපයෙන් පෙනෙන පරිදි ප්‍රධාන දොරටුවේ එදින රාජකාරි කළ ආරක්ෂක නියමක ඩී. පී. එස්. පීරිස් හා ජී. ආරියවංශ යන අය ආරක්ෂක නියාමකවරු වශයෙන් තම රාජකාරිය හරිහැටි ඉටු නොකල බව සාක්ෂි මතින් ඔප්පුකර ඇත. R10 ලෙස සලකුණු කල 2013.11.08 වන දිනට අදල තංගල්ල ඩිපෝවේ සේවකයන්ගේ අත්සන් පැමිණීම පිටවීම දැක්වෙන ලේඛනයේ මේ ආරක්ෂක නියාමක සතරදෙනා පැමිණි බවට අත්සන් කර ඇත.

ආරක්ෂක නියාමකවරු සතරදෙනාට 2013.11.08 දින සුපුරුදු රාජකාරියේ යෙදී සිටි බව ඉල්ලුම්කාර පක්ෂයේ පළමු ප්‍රකාශයේ සඳහන් කර ඇති අතර පී. ඒ. කේ. ප්‍රදීප් මහතා විසින් ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයෙන් ද ඒ බව සඳහන් කර ඇත.

ප්‍රදීප් මහතාගෙන් අසන ලද හරස් ප්‍රශ්ණයට ඔහු ලබාදුන් පිළිතුරෙන් ද එදින සේවය කල බව තහවුරු විය.

ප්‍ර : සාක්ෂිකරු, ඔබ මෙම නඩුවට ඇවිල්ලා සාක්ෂි දෙන්න හේතුව මොකක්ද?

පි : දුගඳ හමන දියරයකින් ආරක්ෂක පරීක්ෂක මහතාට ගහල කියල අපි ඒ ස්ථානයේ සිටින නිසා ඒකට අපේ වැඩ තහනම් කලා. (සාක්ෂි සටහන් 03 පිටුව)

මෙම ප්‍රකාශ හා සාක්ෂි මත මොවුන් එදින රාජකාරියේ යෙදී සිටි බව ඔප්පුවෙයි. තවත් හරස් ප්‍රශ්නයකට ලබාදෙන පිළිතුරු අනුව ආරක්ෂක නියාමකවරු වශයෙන් තමන්ගේ වගකීම පැහැර හැර ඇති බව පෙනේ.

ප්‍ර :''ඔබගේ තනතුරට අදාල රාජකාරි මොනවද''?
පි :''ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ තංගල්ල ඩිපෝවට අයත් නිශ්චල, චංචල දේපල ආරක්ෂා කිරීම''

රාජකාරිය මෙය නම් 2013.08.11 වන දින නියමිත අන්දමින් රාජකාරි ඉටුකලා නම් ප්‍රධාන දොරටුවෙන් පලායන සැකකරු අල්ලා ගැනීමට හැකිවිය යුතුයි. මෙම සැකකරු පලායද්දී අල්ලාගැනීමට නොහැකි වීමෙන් ආරක්ෂක නිලධාරි වශයෙන් ඔවුන්ගේ රාජකාරි හරියාකාරව ඉටු නොකල බව පෙනී යයි. චෝදනා පත්‍රයේ සඳහන් දෙවන චෝදනාව වන,

''ආරක්ෂක නියාමකවරයකු ලෙස ඔබගේ රාජකාරිය පැහැර හැරියේය'' යන චෝදනාවෙන් මොවුනට නිදහස් වීමට හෝ නිදෙස්වීමට ඉඩක් නැත.

ආරක්ෂක නියාමක යනු ආරක්ෂාව සැපයීම රාජකාරිය හා සේවාව සැපයිය යුතු තනතුරකි. තංගල්ල ඩිපෝවේ චංචල හා නිශ්චල දේපල ආරක්ෂා කිරීම ආරක්ෂක නියාමකවරුන්ගේ පරම යුතුකම හා රාජකාරිය විය යුතුය. සැකකරුවකු ඩිපෝ පරිශ්‍රය තුළට පැමිණ කාර්යාලය තුළට පැමිණ කාර්යාලය තුලට ගොස් එහි සිටි නිලධාරියකුට දුගඳ හමන දියරයකින් පහරදී පලායන තුරු ආරක්ෂක නියාමකවරුන් නොදැන සිටීම ඔවුන්ගේ රාජකාරි පැහැර හැරීමක් ලෙසට නිගමනය කරමි. ශ්‍රී ලං.ග.ම. නිලධාරිවරයාට විධිමත් විනය පත්කිරීම සඳහා භාරදීම ද තමන්ගේ නඩුව තමන් විසින් ම ඇසීමක් ලෙස දැක්විය හැකිය.

ඔවුන්ට දඬුවම් දීමේදී සලකා බලා ඇති චෝදනා සතර ඔප්පුකිරීමට තරම් සාක්ෂි බේරුම්කරණ නඩුවේ දී දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. එබැවින් ආරක්ෂක නියාමකවරුන් ලෙස රාජකාරි පැහැර හැරීමේ චෝදනාව පමණක් ඔප්පුවන අයුරින් සාක්ෂි ලබා දී තිබීම නිසා එම චෝදනාවට පමණක් මේ ආරක්ෂක නියාමකවරු 04 දෙනාට නිදෙස්වීම හා නිදහස්වීමට ඉඩක් නොලැබේ. චෝදනා 05 ටම වැරදි කරුවන් නොවී තිබියදී මේ සතර දෙනාටම නියමකර තිබූ දඬුවම් සාධාරණ නොවන බවට තීරණය කරමි. එසේ නම් එක් චෝදනාවකට පමණක් වැරදිකරුවන් වන බවට නිගමනය කරමි. සේවා තහනම් කාලය දඬුවමට යටත් කොට සේවයේ පිහිටුවීමේ දඬුවම ඉවත් කරන ලෙසට නියෝග කරමි.

ඉල්ලුම්කරුවන් සතර දෙනා ගරු බේරුම්කරණ අධිකරණයෙන් අයැද ඇති පරිදි ජී. ආරියවංශ හා කේ. ඒ. පී. පීරිස් යන අයගේ වැඩ තහනම් කාලය වූ මාස 09 දින 14 හා පී. ඒ. කේ. ප්‍රදීප් සහ එස්. එච්. නිමල්සිරි යන අයගේ වැඩ තහනමට ලක් ව තිබූ කාලය වූ මාස 06 දින 15 සඳහා ඔවුන්ට අහිමි කරන ලද වැටුප් යලි ලබාදෙන ලෙසට නියෝග කරමි.

මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පලකරන ලද දින සිට දින 14ක් ඇතුළත හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙතට එම මුදල් තැන්පත් කරන ලෙසට මෙයින් නිගමනය කරමි. තව ද *ගැසට් පත්‍රයේ* පල කල දින සිට මසක් ඇතුළත ක්‍රියාත්මක කොට ඒ බව හම්බන්තොට දිස්ත්‍රික් සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත දැනුම්දිය යුතු බවට ද මෙයින් නියම කරමි. ඉල්ලුම්කාර සේවකයන්ට හිමි සේවක අර්ථ සාධක හා අනෙකුත් දීමනා සම්බන්ධයෙන් ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවේ.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවද සටහන් කරමි.

නීතිඥ ඩී. ජී. කේ. කරුණාරත්න,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 01 වැනි දින.

ECG 11 - 0236

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.